# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 39 දරන
# බැංකු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 නොවැම්බර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 නොවැම්බර් මස 16 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1990 අංක 39 දරන බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 නොවැම්බර් මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 06/90

### 1988 අංක 30 දරන බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1990 අංක 39 දරන බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1988 අංක 30 දරන පනතෙහි IV වන කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ පනතේ IVඅ වන කොටස ලෙස බලපැවැත්විය යුතු ය :— IVඅ අලුත් කොටස 1988 අංක 30 දරන පනතෙහි ඇතුළත් කිරීම.

"IVඅ වන කොටස
අංකිත ගිණුම්

අංකිත ගිණුම් පවත්වා ගෙනයාමට බලය දීම.

34අ. (1) මුදල් මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව කරනු ලබන නියමයක් මගින් වාසික නොවන්නා වූ හෝ විදේශ රටවල පුරවැසියන් වන්නා වූ හෝ ගනුදෙනුකරුවන් වෙනුවෙන්, අංකිත බැංකු ගිණුම් පවත්වා ගෙන යාමට බලපත්‍රලාභී වාණිජ බැංකුවකට අවසර දෙනු ලැබිය හැකි ය.

(2) මේ කොටස යටතේ මුදල් මණ්ඩලය විසින් අවසර දෙන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් විදේශ රටවල පුරවැසියන් වන්නා වූ හෝ වාසික නොවන්නා වූ හෝ ගනුදෙනුකරුවන් වෙත සපයනු ලබන අංකිත ගිණුම් පහසුකම්, ජංගම ගිණුම්, තැන්පත් ගිණුම් සහ ඉතිරි කිරීමේ ගිණුම් කෙරෙහි ව්‍යාප්ත විය හැකි නමුත්, ණය පහසුකම් කෙරෙහි එය ව්‍යාප්ත නොවිය යුතු ය.

(3) මේ කොටස යටතේ මුදල් මණ්ඩලය විසින් අවසර දෙන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් අංකිත ගිණුමක තැන්පත් කිරීම සඳහා භාරගනු ලබන සියලුම මුදල්, මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන විදේශීය ව්‍යවහාර මුදල් වලින් විය යුතු ය.

(4) මේ කොටස යටතේ මුදල් මණ්ඩලය විසින් අවසර දෙන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක විවෘත කර ඇති අංකිත ගිණුමක අයිතිකරු, එම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන, එම බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයන් විසින් පමණක් දැන සිටිනු ලැබිය යුතු ය.

රහස්‍යභාවය.

34අ. (1) ගණුදෙනුකරුවකු වෙනුවෙන් අංකිත ගිණුමක් පවත්වාගෙන යන බලපත්‍රලාභී වාණිජ බැංකුවක සෑම නිලධරයකු ම සහ තමාගේ තත්ත්වයේ හෝ නිලයේ හෝ හේතුවෙන් එම අංකිත ගිණුමට අදාළ, එම බැංකුවේ වාර්තාවලට, ලේඛනවලට, ලිපිගණුදෙනුවලට හෝ වෙනත් යම් දේවලට කිසියම් ප්‍රවේශයක් ඇති සෑම තැනැත්තකු ම, එම ගිණුම අදාළ වන ගණුදෙනුකරුගේ යහපත පිණිස, එම දේවල අඩංගු කරුණු සම්බන්ධයෙන් පරම රහස්‍යභාවය රැකිය යුතුය.

(2) මේ කොටස යටතේ මුදල් මණ්ඩලය විසින් අවසර දෙන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ගනුදෙනුකරුවකු වෙනුවෙන් අංකිත ගිණුමක් විවෘත කරනු ලබන අවස්ථාවක, අංකිත ගිණුමෙහි අයිතිකරුගේ අනන්‍යතාව සම්පූර්ණයෙන්ම අනුලංඝනීය විය යුතු ය. තවද, එම අංකිත ගිණුමෙහි අයිතිකරුගේ නම හෝ අනන්‍යතාවය හෝ පිළිබඳ කවර වූ හෝ යම් තොරතුරක්, කිසියම් පුද්ගලයෙක්, සංස්ථාවක්, බැංකුවක්, අධිකරණයක්, ආයතනයක්, අස්ථිත්වයක්, දෙපාර්තමේන්තුවක්, නිලධරයෙක්, අනුයෝජිතයෙක්, ශ්‍රී ලංකා ආණ්ඩුවේ හෝ වෙනත් යම් ආණ්ඩුවක නියෝජිතයෙක් හෝ වෙනත් යම් නෛතික හෝ ස්වාභාවික හෝ තැනැත්තෙක්, අධිකරණ හෝ හමුදාමය අධිකාරියක් හෝ වෙත එවැනි බලපත්‍රලාභී වාණිජ බැංකුවක සෑම නිලධරයකු ම සහ (1) වන උපවගන්තියෙහි සඳහන් සෑම තැනැත්තකු ම විසින් දෙනු ලැබීම, කියනු ලැබීම නැතහොත් හෙළිදරව් කරනු ලැබීම්—

(අ) එසේ කිරීමට අවසරය එම අංකිත ගිණුමෙහි අයිතිකරු විසින් දෙනු ලැබුවහොත්; හෝ

(ආ) එම අංකිත ගිණුමෙන් උද්ගත වන්නා වූ බැංකු ගිණුමක් සම්බන්ධයෙන්, එම අංකිත ගිණුමෙහි අයිතිකරු විසින් එම බලපත්‍රලාභී වාණිජ බැංකුවට එරෙහිව හෝ එම බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් එම අංකිත ගිණුමෙහි අයිතිකරුට විරුද්ධව හෝ නඩු කටයුතු ආරම්භකර ඇත්නම්; හෝ

(ඇ) (i) කිසියම් අධිකරණයක, විශ මත් ද්‍රව්‍ය හෝ පැහැර ගෙන යෑම හෝ පිළිබඳ වූ ජාත්‍යන්තර සම්මුතියක් ක්‍රියාවේ යෙද වීමේ කිසියම් නීතියක් යටතේ පවරනු ලැබ ඇති කිසියම් නඩු කට යුත්තක දී ඒ නීතියෙහි කිසියම් විධි විධානයක් මගින් එසේ හෙළිදරව් කරන ලෙස නියම කර ඇත්නම්;

(ii) එම ගිණුම්වල මුදල්, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වරදක් සමත්විත කරන කිසි යම් ක්‍රියාවක් තවදුරටත් කර ගෙන යාම පිණිස, යොදා ගෙන ඇති බවට හෝ දැනටත් යොදා ගන්නා බවට වූ හේතුව මත, ඒ සඳහා වූ ඉල්ලීමක් පිට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරනු ලබන ආඥාවක් මගින් එසේ හෙළිදරව් කරන ලෙස නියම කර ඇත්නම්;

මිස, නොකළ යුතු ය.

34ඇ. (1) අංකිත ගිණුම් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ද, 20 වන වගන්තියෙහි හෝ 21 වන වගන්තියෙහි හෝ කාර්යයන් සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවක තැන්පතු වගකීම් ආගණනය කිරීම පිණිස එම ගිණුම්වල තිබෙන්නා වූ මුදල් ඇතුළත් කිරීම හෝ අත්හැරීම හෝ ඇතුළුව එම ගිණුම් සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි සීමාකිරීම් සම්බන්ධයෙන් ද අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

34ඈ. මේ පනතේ කාර්යයන් සඳහා— අර්ථ නිරූපණය

(i) "විදේශ රටක පුරවැසියා" යන යෙදුමෙන් ශ්‍රී ලංකාවෙහි පුරවැසියකු නොවන්නා වූ හෝ ශ්‍රී ලංකාවෙහි සහ වෙනත් කිසියම් රටක පුරවැසියකු වන්නා වූ හෝ තැනැත්තකු අදහස් වේ;

(ii) "වාසික නොවන" යන්නට 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ ඇති අර්ථය ම විය යුතු ය;

(iii) "අංකිත ගිණුම" යන යෙදුමෙන් අංකයකින්, සංකේත වචනයකින් හෝ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වෙනත් ක්‍රමයකින් පමණක් හඳුනාගනු ලබන, මේ කොටස යටතේ මුදල් මණ්ඩලය විසින් අවසර දෙන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක විවෘත කරන ලද ගිණුමක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය පහත දැක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (1අ) 34අ වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක්, මේ පනත යටතේ වරද කට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු තුනකට නොවැඩි කාල සීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් එක් මිලියනයකට නොවැඩි දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම ද, එම වරද දැනුවත්ව හෝ ඕනෑකමින් ම හෝ එයින් වෙනත් යම් තැනැත්තකුට අලාභයක් හෝ හානියක් සිදු වේ යයි විශ්වාස කිරීමට හේතු ඇතිව හෝ කරනු ලබන අවස්ථාවක, අවුරුදු පහකට නොඅඩු වූ ද අවුරුදු දහයකට නොවැඩි වූ ද කාල සීමාවක් සඳහා බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කරනු ලැබීමට සහ රුපියල් එක් මිලියනයක් හෝ එම ගිණුමෙහි තිබෙන බවට දක්වා ඇති හෝ හෙලිදරව් කර ඇති ප්‍රමාණය මෙන් ශ්‍රී ලංකා මුදලින් දෙගුණයක් යන මේ දෙකින් වඩා වැඩි මුදලක දඩයක් ගෙවීමට ද ඔහු යටත් විය යුතු ය." ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "(1) වන උපවගන්තිය යටතේ" යන ඉලක්කම් සහ වචන වෙනුවට "(1) වන උපවගන්තිය හෝ (1අ) වන උපවගන්තිය හෝ යටතේ" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂාපාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.